# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

## දෙමෝදර අංගණය සඳහා EN45E1 රේල් පීලි සඳහා ගැළපෙන උසින් අඩු කොන්ක්‍රීට් සිල්පර 3,000 ක් සැපයීම සඳහා ප්‍රසම්පාදනය

### IFB අංකය - SRS/F.8118

1. කොළඹ, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන), සභාපති විසින් දෙමෝදර අංගනය සඳහා EN45E1 රේල් පීලි සඳහා ගැළපෙන උසින් අඩු කොන්ක්‍රීට් සිල්පර 3,000 ක් සැපයීම සඳහා දේශීය නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.
2. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය (NCB) මගින් ලංසුකරණය මෙහෙයවේ.
3. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට 2025/09/26 සිට 2025/10/21 දින දක්වා වැඩකරන දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලයේදී පහත දැක්වෙන ලිපිනයෙන් වැඩිදුර තොරතුරු ලබාගැනීම සහ ලංසු ලිපි ලේඛන පරීක්ෂා කොට බැලීම සිදුකළ හැක.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**<br>
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**<br>
**ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

**දුරකථන අංක : 94(11)2438078 හෝ 94(11)4600202**<br>
**ෆැක්ස් අංකය : 94(11)2432044**<br>
**ඊමේල් : srs.slr@gmail.com,tender1@railway.gov.lk**<br>
**වෙබ් අඩවිය : www.railway.gov.lk**

4. පසුගිය වසර පහක (05) කාලය තුළ ලංසුකරු, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත කොන්ක්‍රීට් සිල්පර 5,000 ට වැඩියෙන් හෝ රුපියල් මිලියන 50 ට වැඩි වටිනාකමින් යුත් වැර ගැන්වූ කොන්ක්‍රීට් බාල්ක හෝ රුපියල් මිලියන 500 ට වැඩි වටිනාකමින් යුත් වැරගැන්වූ කොන්ක්‍රීට් කණු සපයා තිබිය යුතුය. ඉන්වොයිස් පිටපත් ඉදිරිපත් කළ යුතුය.
5. ආපසු නොගෙවන ප්‍රසම්පාදන ගාස්තුව රු. 18,450/= ක් පමණක් ගෙවීමෙන් අනතුරුව, ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවත, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුවේ කාර්යාලය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් 2025/09/26 දින සිට 2025/10/21 දින ප.ව. 3.00 දක්වා අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සැකසී ඇති ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැක.
6. සියලුම ලංසු සමග ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය. ලංසු සුරක්ෂණයේ වටිනාකම රු. 900,000.00 ක් විය යුතු අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවක් විසින් නිකුත් කරන ලද කොන්දේසි විරහිත ඇපකරයක් විය යුතුය.
7. 2025/10/22 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර පහත ලිපිනය වෙත ලංසු ගෙනවිත් භාරදිය යුතු අතර, ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වන මෙන් ඉල්ලා සිටිනු ලැබේ. ප්‍රමාදවී ලැබෙන ලංසු නොපිළිගැනේ.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**<br>
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,**<br>
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**<br>
**ඕල්කට් මාවත, කොළඹ 10.**

**සභාපති,**<br>
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**<br>
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**

**යොමු අංකය : SRS/F.8118**